වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර
සංවර්ධන අමාත්‍යාංශය

# ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
# පොල්ගොල්ල

## පුරප්පාඩු තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම.

2001 අංක 01 දරණ පාර්ලිමේන්තු පනතින් සංස්ථාගත කර ඇති මහනුවර, පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම්ලත් අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. පුරප්පාඩු තනතුර,**

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේතය | වැටුප් පරිමාණය |
|---|---|---|---|---|
| 01. | අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) | 01 | HM 1-1 | රු.80,295 - 15×2,270/- = රු.114,345/- |

**2. සෑම අයදුම්කරුවෙක්ම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii' තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**3. සේවා නියුක්ති කිරීමේ කොන්දේසි**

i. මෙම තනතුර ස්ථිරය.

ii. පුරප්පාඩු තනතුර සඳහා බඳවා ගනු ලබන සෑම තැනැත්තෙක්ම සේවක අර්ථසාධක අරමුදල් පනතට අනුව තම ඉපැයීම්වලින් 8% ක දායකත්වයක් ලබා දිය යුතු අතර, ආයතනය විසින් මේ සඳහා 12% ක දායකත්වයක් ලබා දෙනු ඇත. සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට බඳවා ගන්නා තැනැත්තෙකුගේම ඉපැයීම්වලින් 3% ක දායකත්වයක් ආයතනය විසින් ලබා දෙනු ඇත.

iii. මීට අමතරව රජය විසින් වරින් වර දෙනු ලබන මූල්‍ය ප්‍රතිලාභ හා තනතුරට අදාළ අනෙකුත් ප්‍රතිලාභ සඳහා හිමිකම් ඇත.

iv. බාහිර අයදුම්කරුවන්ගෙන් බඳවා ගන්නා තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, අභ්‍යන්තර අයදුම්කරුවන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් එක් අවුරුදු වැඩ බැලීමේ/පරීක්ෂණ කාලසීමාවකට යටත් වනු ඇත.

v. බඳවා ගන්නා සෑම තැනැත්තෙක්ම අවම වශයෙන් තුන් අවුරුදු කාලයක්වත් තනතුරෙහි රැඳී සිටිමින් සේවය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

vi. බඳවා ගන්නා තනතුරට අදාළ නිත්‍ය සේවා ස්ථානය පොල්ගොල්ල, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය වන අතර අවශ්‍යතාවය අනුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි ඉටුකිරීම කළ යුතු වේ.

**4. සුදුසුකම් ලබන දිනය**

තනතුරට පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**5. අයදුම්කළ යුතු ආකාරය**

ඉහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමේදී සලකා බලනු ලබන සුදුසුකම් හා ඊට අදාළ සියලු විස්තර ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ **www.nicd.edu.lk** යන නිල වෙබ් අඩවියට ප්‍රවේශ වීමෙන් ලබා ගත හැකිය.

i. පුවත්පතේ දැන්වීමට අනුව මෙම ආයතනයේ නිල වෙබ් අඩවියේ සඳහන් ආදර්ශ අයදුම් පත්‍රයට අනුව සකස් කර සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය මගින් තනතුර සඳහා අයදුම් කළ යුතු අතර, අයදුම් පත්‍රයේ සඳහන් සුදුසුකම් සනාථ කිරීමේ සහතික පත්‍රවල සහතික කළ ඡායා පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු වේ.

ii. තවද දැනටමත් රජයේ/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත ආයතන/ උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

iii. අයදුම්පත්‍රය බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) තනතුරට අයදුම් කිරීම යනුවෙන් සඳහන් කළ යුතුය.

iv. අයදුම්පත් භාර ගැනීම **2025.02.24** දිනෙන් අවසන් වන අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් එදිනට හෝ එදිනට පෙර ලැබෙන සේ **"අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, පොල්ගොල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

v. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ, මූලික සුදුසුකම් සපුරා නොමැති හා මූලික සුදුසුකම් සපුරා ඇති බවට සහතික පිටපත් මගින් සනාථ කර නොමැති, නිසි පරිදි ඉදිරිපත් නොවූ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

vi. තනතුරට බඳවා ගැනීමට කවරාකාරයකින් හෝ බලපෑම් කිරීම නුසුදුසුකමක් සේ සලකනු ලැබේ.

**සැ.යු.** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය හෝ ඉහත බඳවා ගැනීමට අදාළ වෙනත් කරුණක් සම්බන්ධයෙන් යම් සංශෝධනයක් සිදු වුවහොත් ආයතනික නිල වෙබ් අඩවියේ ඒ බව යාවත්කාලීන කරනු ඇත.

**අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී,**
**ජාතික සමුපකාර සංවර්ධන ආයතනය,**
**පොල්ගොල්ල**
**2025.01.24**

SELACINE